


# රාජ්‍ය ත්‍රස්තවාදී බලවේගය හිස ඔසවයි

අද රට තුල ක්‍රියාත්මක වන රාජ්‍ය ත්‍රස්තවාදී බලවේගය ගැන කවුරුත් හිත යොමුකරල තියෙන්නේ. මේක එළියට ආවේ භාරත ඝාතනයත් එක්කයි. කවුරුත් පුදුමවුනා කොහොමද මෙහෙම දෙයක් වුනේ කියල. මන් දිගට ම පෙන්වල දුන්න මෙහෙම බලවේගයක් යටින් ගමන් කරන බව. ඒත් හුඟ දෙනෙක් ඒ ගැන කල්පනා කලේ නෑ. විශේෂයෙන් ම උතුරේ ඇතිවෙලා තියෙන තත්ත්වය ගැන ඒ ඇත්තෝ කල්පනා කලේ වෙන මොනව කරන්නද කියන සංකල්පයෙන්.

කොටි කැරැල්ල මැඩ පැවැත්වීම වෙනුවෙන් රාජ්‍ය ත්‍රස්තවාදී සංවිධිත බලයක් අවශ්‍ය වෙනව කියලයි ඔවුන් හිතුවේ. මහසෝනා ව නැත්නම් හූනියම් යක්ෂයාට කියල හරි මේකව යටපත් කරන්න ඕනා කියල ඔවුන් ආධාර කලා. එත් දැන් දැන් උගත් මැද පංතික සිංහල ජනයාට වුනත් තේරේනව එම ගමනේ දී එකට එකතු වුන රාජ්‍ය ත්‍රස්ත බලයන් කොටි දඩයම හරහා සිහසුන් ගත වෙලා කියල. ඇත්තට ම ඒ ගැන නම් එච්චර හිතන්න දෙයක් ඇත්තේ නෑ. උඩින් පල්ලෙන් බලන කෙනෙකුට වුනත් මේක පෙනෙනව.

භාරත මරන්න පුළුවන් නම්, ලන්සා ඇමතිගේ ගෙදරට කඩා වදින්න පුළුවන් නම් මේ බලවේගය එක විදියකට ජනාධිපතිටත් අභියෝග කරන ආයතනයක්. උතුරේ ක්‍රියාත්මක වුන රාජ්‍ය ත්‍රස්තවාදී බලය දකුණටත් ඇවිදින්. මල ජූලියයි ඒ මොකටද? මේක තමා ප්‍රශ්නය. උතුරේ දී හමුදාව ම කිව්වේ හැම බිම් අඟලක් ම ඒ අගේ තියුණු විමසුමට ලක්වෙලා තියෙන්නේ කියල.

එහෙම නම් මේ අයතා ක්‍රියාවන් කරල තියෙන්නේ හමුදාවේ අනු දැනුම ඇතිව ද කියන ප්‍රශ්නය මතු වෙනව. හැම තැනම හමුදා විමසුම තියෙන කොට බරපතල අයතා, අපරාධ ක්‍රියා ඇතිවෙන්න ක්‍රමයක් තියෙනව ද? එතකොට ආණ්ඩුව මැතක දී ග්‍රීස් යකා ගැන කිය කියා රට පුරා හැම තැනම හමුදාව මුදා හැරිය. හදිසි නීති ඉවත් කලත් හමුදාව පතුරුවා හැරීම නැවතුනේ නෑ. ඒ නිසා දකුණෙ ඇති වුන ඉහත දැක්වූ බරපතල ක්‍රියා මේ හමුදා රාජ්‍ය ත්‍රස්තවාදය හරහා ඇති වුනා ද කියල හිතන්න වෙන ව.

මේ අනුව උතුරේ කැරැල්ල මැඩ පැවැත්වීම සඳහා කල මෙහෙයුම් අපට ලබා දීල තියෙන්නේ රාජය ත්‍රස්තවාදයෙන් මර්ධනය වන ලංකාවක්. මේ



මර්ධනය ගෙනියන්නේ රාජ්‍ය ත්‍රස්තවාදී ආයතනයකින් කියල අපි කිව්වේ ඒ ගැන කල්පනා කරල. ඒත් මෑත දී සිදුවන දේවල් දිහා බලන කොට අපට පෙනෙනව රාජය ත්‍රස්තවාදය දැන් රට පුරා ම ක්‍රියාත්මක වෙන බව. භාරත වගේ ම ලන්සා සිද්දියෙන් පෙනනව මේ දෙන්නට ම තර්ජන ආවේ රාජ්‍ය ත්‍රස්තවාදී සංවිධානයකින් බව.

මේ රාජය ත්‍රස්තවාදය ඇති වුනේ ඒකාධිපති ව්‍යවස්ථාව උඩ ම යි කියල අපට කියන්න බෑ. මොකද? ඒකාධිපති ව්‍යවස්ථාව ඇති කරල දැන් සෑහෙන ගමනක් අපි ඇවිත්. ව්‍යවස්ථාවටත් වැඩියෙන්, දරුණු බලපෑමක් එල්ල වෙන්න පුළුවන් ජාතිවාදී දේශපාලන බලවේගයන් එකට ගොනු වුනොත්. ඒ අනුව අපට මෙහෙම කියන්න පුළුවන්. මේ රාජ්‍ය ත්‍රස්තවාදයේ දේශපාලන මඨවාදය හැටියට ක්‍රියා කරන්නේ නලින් සිල්වා, ගුණදාස අමරසේකර වැනි සිංහල පඬිවරු ගොඩ නගපු ජාතිවාදය යි. එදා මේ දෙපලත්, බෙන්ගමුවේ නාලක වැනි භික්ෂූන් වහන්සේලාත් එකතු වෙලා ඉදිරිපත් කල නායකත්වයට ලොකු ඉඩකඩක් ලබා දීල තිබුණ. තවමත් සමහරු කල්පනා කරන්නේ මේ සිංහල පඬිවරුන් වෙනුවට අපේ වියතුන් කියන අයටත් වැඩි වැටුප් ලබා දෙනව නේද කියල යි.

මේ සිංහල පඬිවරු විශ්වාස කල ජනතාවට දැන් දැන් තමන්ගේ තත්ත්වයත් රට තුල මතුවන විපතත් ගැන කල්පනා කරන්න වෙලා. ඉතා ම දූෂිත, මත් ජාවාරම් කාරයින් පවා සිංහල ජාතිය රැකීමේ බලවේගය ගැන කථා කරමින් රට විනාශ කරන බව තරමක් හෝ පසුගිය සිද්ධීන් වලින් එළිදරව් වුනා. ඒ අනුව යටි තලයේ ක්‍රියාත්මක වන රාජ්‍ය ත්‍රස්තවාදයේ මඨවාදී පදනම ලබා දෙන්නේ මේ ඊනියා සිංහල ජාතිවාදය යි. සිංහලවාදය පතුරවන අය ඇත්තට ම කරන්නේ ලෝක බලවතුන්ට රට විකුණන ගමන ආරක්ෂා කරන එකයි. රාජ්‍ය
ත්‍රස්තවාදයට නීතිමය රැකවරණයක් ලැබෙන්නේ ඒකාධිපති ව්‍යවස්ථාව හරහා යි. නීතියේ අධිපති බව ඉක්මවා විධායක ජනාධිපති බලය පිහිටුවීම නිසා නීතිය කුණු ගොඩට වැටුන තත්ත්වයක් උදා වුනා. නීතිය අනුව කටයුතු කරන නිලධාරීන්ට තම ගරුත්වය රැක ගන්න බැරිවෙලා. ඒ අනුව තමන්ගේ රාජකාරිය කරන්න හයියක් නැති වෙලා නිකම්ම දෙකේ කොලයට වැටිල ඉන්න සිද්ධ වුනා.

පසුගිය දවස් වල සිදුවුන සිද්ධි වලින් පෙනුනා නීතිය රැකීමට ඉන්න නිලධාරීන් ම නීතිය කැඩීමට යොදා ගත් බව. රාජ්‍ය ත්‍රස්තවාදයේ අනෙක් බලකනුව මෙසේ නීතියේ බිඳ වැටීම උදාකල ඒකාධිපති ව්‍යවස්ථාව යි. මේ විදියට එක පැතතකින් සිංහලවාදී  මඨයත් අනෙක් අතට ඒකාධිපති ව්‍යවස්ථාවත් රාජ්‍ය ත්‍රස්තවාදයට උවමනා පසුබිම සකස් කලා. ඒ
දෙකට හේත්තු වෙලා තමයි මේ ත්‍රස්ත බලය රට පුරා ක්‍රියාත්මක වන තැනට පත් වුනේ. සමහරු හදනව දැන් සිංහලවාදී මතවාදයෙන් සිදුවුන වැඩ කොටස වහන්න.

ඒ අය දැන් කථා කරන්නේ 18 වන ව්‍යවස්ථා සංශෝධනය ගැන පමණ යි. ඒ උඩ මේ නීතිය කඩා වැටුන. නීතියේ අධිකාරී තත්ත්වය නැතිව ගියා කියල ඒ අය සද්ද කරනව. නමුත් ඒ විධියට 18 වන ව්‍යවස්ථා සංශෝධනයට බර දමන අය කරන්නේ සමාජයේ කඩා වැටීමට ජාතිවාදී මඨය හේතු වුනා ය යන සත්‍ය යටපත් කිරිම යි. දෙමල ජාතියට සිදුවූ අකටයුතු කම් උඩ ඇතිවුන බෙදීම ලාංකික සිවිල් සමාජය බිඳවැටිමට හේතු වුනා. ව්‍යවස්ථාවට අරබූදයක් ඇති වුනේ එතැනින්.

ජනාධිපති ක්‍රමය ආවේ ඒකට විස’දුමක් දෙන බවක් පෙන්නුම් කරමින්. ඒත් ඒක පසු ගිය කාලයේ මේ ව්‍යවස්ථාව යොදා ගත්තේ සිංහල ජාතිවාදී බලය තහවුරු කර ගැන්ම සඳහා යි. පසුගිය ජනාධිපති ඡන්දය ක්‍රියාත්මක වුනේ ජාතිවාදී බෙදීමක් තුලයි. මහින්ද බලයට ආවේ සිංහල බෞද්ධ පදනම මත. අනෙක් ජාතික කොටස යට කිරීමක් වුනා කියල ඒ ඡන්දය දිහා බැළුවහම පෙනෙනව. ඒ නිසා ජාතිවාදී බෙදීම ගැන කථා නොකර නිකම්ම ව්‍යවස්ථාවේ ඒකාධිපතිවාදය ගැන කථා කිරීම තේරුමක් නැහැ. ප්‍රජාතන්ත්‍රවාදය ගොඩ නැගීම වෙනුවෙන් දේශපාලන ව්‍යාපාරයක් ගොඩ නගනව නම් එය අනිවාර්යයෙන් ම ජාතික ප්‍රශ්නයට විසඳුමත් ගැන කථා කල යුතුයි. අඩු තරමේ 13 වන ව්‍යවස්ථා සංශෝධනය ධනාත්මකව ඉදිරියට ගෙන යනව කියල කියන එක අවශ්‍ය වෙනව.

අනිත් එක මේ රාජ්‍ය ත්‍රස්තවාදී බලවේගය මොන පංතියට ද සේවය කරන්නේ? අද නව ලිබරල්වාදී ආර්ථික සංවිධාන මෙරට යටත් කර ගැන්මට ක්‍රියා කරගෙන යනව. ඔවුන්ට උවමනා දැඩි වෙනස් කම් මේ රට තුල ඇති කර ගන්නට අදාල උපකරණයක් අවශ්‍යයි. ජනතාව තමන්ගේ භූමියෙන් උදුරා දැමීම, පරිසරය විනාශ කිරීම, සම්පත් උදුරා ගැන්ම ආදී වැඩ කටයුතු කල හැක්කේ බලහත්කාරයෙන් පමණයි. රාජ්‍ය ත්‍රස්තවාදී බලය යොදා ගන්නේ මේ වැඩ වලටයි. ■

නවවන පිටෙන්

## නියම හීරලුවා

චරිතාංග නලුවෙකු ලෙස ජේ.එච්. කොතරම් සාර්ථක රංගන කුසලතාවක් ප්‍රදර්ශණය කළේද යන්න ඔහු රගපෑ නාට්‍ය සහ චිත්‍රපටි නරඹා ඇති කිසිවෙකුට නැවත සිහිපත් කරදිය යුතු නොවේ. ‘අධිෂ්ඨානය’ චිත්‍රපටියේ ඔහු රගපෑ භික්ෂු චරිතය ඒ සඳහා එක් උදාහරණයක් පමණි.



‘අධිෂ්ඨානය චිත්‍රපටිය කළේ සතිස්චන්ද්‍ර එදිරිසිංහ. මාව හොයාගෙන ගෙදරටම ඇවිල්ලා මට පිටපත දීලා කිව්වා මේකේ භික්ෂුවගේ චරිතය කරන්න කැමතිද කියලා. මම හීනෙකින්වත් හාමුදුරු චරිතයක් ගැන හිතලා තිබුණේ නැති නිසා මම කිව්වා මම කොහොමද ඔය වගේ චරිතයක් කරන්නේ කියලා. නෑ මේක ජේ.එච්. ට කරන්න පුළුවන් කියලා සතිස්චන්ද්‍ර කිව්වා. මම චරිතය කරන්න බාරගත්තා. පිටපත කීප සැරයක් කියවලා බලලා කදානේ ශ්‍රී වර්ධනාරාමයේ ජීවානන්ද ලොකු හාමුදුරුවෝ හම්බ වෙන්න ගිහිල්ලා හාමුදුරු චරිතයක් කරන හැටි ගැන ඇහුවා. හාමුදුරු කෙනෙකුගේ ඇවතුම් පැවතුම් ගැන මට ලොකු හාමුදුරුවෝ කියලා දුන්නා. මේවා හොදට අධ්‍යනය කරලා ඔන්න මම වැඩේට බැස්සා. ෂූටිං තිබුණේ පැල්මඩුල්ල පිරිවෙණේ. මෙන්න ෂූටිං යන අතරේ උපාසක අම්මලා ඇවිත් මට වදින්න පටන් ගත්තා. පිරිවෙණේ ලොකු හාමුදුරුවොත් ෂූටිං කරනවා බලාගෙන ඉදලා තියනවා. ටික වෙලාවක් බලං ඉදලා සතිස්ට කියලා තියනවා නියම හීරලුවෙක්නේ ගෙනල්ලා තියෙන්නේ කියලා’

සිංහල සිනමාවේ ස්වර්ණමය යුගය ලෙස සැළකිය හැකි හැත්තෑව අසූව දශකවල එහි නිරත වූවෝ සැබෑ කැපවීමකින් සහ වෘත්තීය ගෞරවයකින් ඒ කටයුතු සිදුකළ නමුත් අද තත්ත්වය ඊට හාත්පසින්ම වෙනස් බව ජේ.එච්. පවසයි. එදා භික්ෂු චරිතයක් නිරූපනය කරන නලුවා ඒ කාලය තුළ අරධ වශයෙන් භික්ෂු ජීවිතයක් ගතකළ බවත් රංගනයේ තාත්විකභාවයට ඒ කැපවීම බෙහෙවින් බලපෑ බවත් ඔහු පවසයි. එහෙත් අද කැමරාව ඉදිරියේ භික්ෂු චරිතයට පෙනී සිටින නලුවන්  සිවුර පිටින්ම කැමරාව පසුපසට ගොස් සිගරට් උරන්නට නොපැකිළෙන බවත් ඔහු කියයි. අද නලුවන් ලෙස තිරයේ පෙනී සිටිනන් බොහෝ දෙනෙකුට කරන්න පුලුවන් රගපෑම ප්‍රේමකිරීම පමණක් බවත් ජේ.එච්. ගේ අදහසයි.

පැය කීපයක් පුරා එක දිගට සිදුවූ අපගේ සාකච්ඡාවට බොහෝ කරුණු විෂය විය. ජේ.එච්. වේදිකාවේ, සිනමාවේ පමණක් නොව සැබෑ ජීවිතයේදී ද බෙහෙවින් යථාර්ථවාදී මිනිසෙකු බවත්, සමාජීය සහ දේශපාලනික කරුණු සම්බන්ධයෙන් උනන්දුවක් සහ සංවේදීතාවක් දක්වන්නකු බවත් එහිදී පසක් විය. ඇදේ වැතිර කළ අපගේ කතා බහ අවසානයේ ඡායාරූප කීපයක් ගැනීම සඳහා ඔහු ඇදේ හිදගත්තේ ද බොහෝ අපහසුවෙනි. එහෙත් මේ එකදු කරුණක් හේතුවෙන් හෝ ඔහු තුළ කිසිදු පශ්චාත්තාපයක් නැත. සැබවින්ම එය මිනිසුන් අතර විරල ගුණයකි.

සටහන සහ සේයාරූ
ශ්‍රීලාල් සෙනෙවිරත්න

MONT ALBERT DENTISTS P/L
For all Your Dental Requirements

We Provide
GENERAL DENTAL TREATMENT
COSMETIC DENTAL
TEETH WHITENING
PARTIAL/FULL DENTURES
EMERGENCY SERVICES

WE ACCEPT COMMUNITY DENTAL VOUCHERS, TEEN VOUCHERS, ALL PRIVATE HEALTH INSURANCES AND MEDICARE VOUCHERS FOR APPROVED PATIENTS.

FOR APPOINTMENTS
9890 3609

DISCOUNTS
FOR FAMILIES,
FREE CHECK UPS
FOR KIDS UNDER
7 YEARS

DR. ENOKA JAYATILAKEBANDA (BDS)

MONT ALBERT DENTISTS

2A CHURCHILL ST
MONT ALBERT VIC 3127
(CLOSE TO BOX HILL CENTRAL)